පී. ඒ. ලෙස්ලි ගාමිණී
රේගු මාධ්‍ය ප්‍රකාශක / රේගු අධ්‍යක්ෂ
රේගු මාධ්‍ය ප්‍රකාශක



# රේගුවයි ඔබයි 3

## කැටුව ගෙන නොයන පෞද්ගලික ගමන් භාණ්ඩ ශ්‍රී ලංකාවට යැවීම

විදේශයක සිට ශ්‍රී ලංකාවට යන ශ්‍රී ලාංකික මගියකු විසින් තමා එතෙර දී පාවිච්චි කළ පෞද්ගලික ගමන් භාණ්ඩ ශ්‍රී ලංකාවට යැවිය හැකිය. තම පෞද්ගලික ගමන් භාණ්ඩ යවන පුද්ගලයා මෙරට තිබෙන අදාල නියෝජිත කාර්යාලයට භාණ්ඩ භාර දීමෙන් පසු මෙම භාණ්ඩ ශ්‍රී ලංකාවේ විවිධ ස්ථානවල පිහිටි මගී බැදි ගුදම්වලට යැවිය හැකිය.

මෙම භාණ්ඩ තීරු බද්දෙන් තොරව ලබා ගත හැකිවේ. එසේ තීරු බද්දෙන් නිදහස් දීමනාව හිමි වන්නේ ඔහු හෝ ඇය විසින් ශ්‍රී ලංකාවට යන විට ගෙන යන පෞද්ගලික ගමන් භාණ්ඩ සදහා ලබා දෙන තීරු බද්දෙන් නිදහස් දීමනාව අඩු කිරීමෙන් පසු ඉතිරි වූ තීරු බද්දෙන් නිදහස් දීමනාවයි. වාණිජමය ස්වරූපයෙන් එවන භාණ්ඩ හෝ පෞද්ගලික ස්වරූපයේ නොවන මෝටර් රථ අමතර කොටස් වැනි දේ සදහා මෙම තීරු බදු වරප්‍රසාදය හිමි නොවේ. ඒ සදහා තීරු බදු අය කරන අතර. විශාල ප්‍රමාණයේ අධිශීතකරණ, විශාල ප්‍රමාණයේ රූපවාහිනි යන්ත්‍ර හා විශාල ප්‍රමාණයේ වායු සමීකරණ යන්ත්‍ර ආදිය වැනි දෑ ද තීරු බද්දෙන් නිදහස් දීමනාවට යටත් නොවේ. මෙම භාණ්ඩ ශ්‍රී ලංකාවට යැවීමේ දී යවන පුද්ගලයාගේ නම හා ලබන පුද්ගලයාගේ නම ලෙස එකම පුද්ගලයකුගේ නම, එනම් භාණ්ඩ හිමියාගේ නම සදහන් වීම වැදගත් ය. එවන පුද්ගලයා හා ලබන පුද්ගලයාගේ නම් එකිනෙකට වෙනස් නම් එය ත්‍යාගයක් ලෙස සැළකෙන අතර, එයට නිදහස් තීරු බදු දීමනාව අහිමි වනු ඇත.

පෞද්ගලික භාණ්ඩ ලෙස කටුනායක ගුවන් තොටුපලේ දී විදේශයේ සිට ශ්‍රී ලංකාවට පැමිණෙන විට හෝ නොකැටුව ගෙනෙන භාණ්ඩ ලෙස වාණිජමය ස්වරූපයේ භාණ්ඩ රැගෙන එන්නේ නම් මගීන්ට සදහා ලැබෙන තීරු බදු සහනය නොලැබෙන අතර, තීරුබදු හා අනෙකුත් බදු අය කිරීමට අමතරව භාණ්ඩවල වටිනාකමට අනුව දණ්ඩන මුදලක් ද අය කර ගනු ලැබේ.

යම් හෙයකින් විදේශයේ සිට තමාගේ නමින්ම ශ්‍රී ලංකාවට එවන ලද තම පෞද්ගලික ගමන් භාණ්ඩ රේගුවෙන් මුදා ගෙන යාමට පෙර, නැවත වරක් තමාට විදෙස් ගත වීමට සිදුවුවහොත්, පහත සදහන් ලියකියවිලි සූදානම් කරගත යුතු වේ.

- තමා කලින් ශ්‍රී ලංකාවෙන් පිටවූ දිනය හා විදෙස් රටට පැමිණි දිනය සටහන් වූ ගමන් බලපත්‍රයේ පිටුවල සහතික කළ ඡායා පිටපත්,
- ශ්‍රී ලංකාවට පැමිණුන දින ගුවන් තොටුපලේ දී රැගෙන ගිය ගමන් භාණ්ඩ සදහා ලබා දුන් තීරුබදු සහනය සම්බන්ධ රේගු සටහන් ඇතුළත් පිටුවල ඡායා පිටපත්,
- තමා නැවත වරක් විදෙස් ගත වුණු පසු මගී භාණ්ඩ රේගුවෙන් නිශ්කාෂණය කර ගැනීම සදහා යම් පුද්ගලයකුට බලය පවරන බවට නීතිඥවරයෙක් විසින් ලියා සහතික කරන ලද ඇටෝර්නි බලපත්‍රය,

ඉහත සදහන් ලියවිලි සමග තමා විදේශගතවීමට ප්‍රථම රේගු මගී සේවා අංශයේ රේගු අධ්‍යක්ෂවරයා වෙත හෝ තමා නැවත වරක් ශ්‍රී ලංකාවෙන් පිටත්වන දින ගුවන් තොටුපලේ පිටවීමේ පර්යන්තයේ සේවයේ නියුතු මාණ්ඩලික නිලධාරියා වෙත ඉදිරිපත් කර, අවශ්‍ය සටහන් යොදා ගැනීමෙන් පසු, ඇටෝර්නි බලපත්‍රය ඇටෝර්නි බලකරු හෙවත් බලය පැවරූ පුද්ගලයා වෙත ආපසු භාර දී පිටත් විය යුතු වේ.

ශ්‍රී ලංකාවට භාණ්ඩ පැමිණි පසු ඊට අදාල ලියවිලි සමග ඇටෝර්නි බලපත්‍රලාභියා විසින් ඇටෝර්නි බලපත්‍රය රේගුවට ඉදිරිපත් කිරීමෙන් පසු තීරු බද්දෙන් නිදහස්ව එකී භාණ්ඩ මුදා ගෙන යා හැකිය.

විදේශයේ දී මිය ගිය පුද්ගලයකුගේ මෘත ශරීරය සමග හෝ නොමැතිව ඔහුගේ හෝ ඇයගේ පෞද්ගලික ගමන් බඩු ශ්‍රී ලංකාවට පැමිණීමේ දී තීරු බද්දෙන් තොරව ඔහුගේ හෝ ඇයගේ මගී භාණ්ඩ නිදහස් කරනු ලැබේ.

පාවිච්චි කර ඉවත දමන ලද විදුලි උපකරණ, විදුලි මෙවලම් හා ගෘහ උපකරණ, පාවිච්චි කරන ලද ශීතකරණල පාවිච්චි කරන ලද වායු සමීකරණ යන්ත්‍ර ආදි දේ කැටුව හෝ නොකැටුව ගෙන ඒමේ ප්‍රවණතාවයක් දක්නට ලැබේ. ඒ නිසා මෙවැනි අනවශ්‍ය ද්‍රව්‍ය ශ්‍රී ලංකාවට ගෙන ඒමට රේගුව දිරි ගන්වනු නොලබන අතර, එවැනි උපකරණ ගෙන ඒමෙන් වළකින ලෙස දන්වනු ලැබේ.

## ශ්‍රී ලංකාවට මුදල් ගෙන යාම සහ ශ්‍රී ලංකාවෙන් මුදල් ගෙන ඒම

### ශ්‍රී ලංකාවේ මුදල් ගෙන ඒම හෝ ගෙන යාම

ශ්‍රී ලංකාවට පැමිණෙන විට හෝ ශ්‍රී ලංකාවෙන් පිටවන විට එක් අයෙකුට රුපියල් 20,000 ක් නොඉක්මවන ශ්‍රී ලංකා ව්‍යවහාර මුදල් නෝට්ටු ශ්‍රී ලංකාව තුළට ගෙන ඒම හෝ ශ්‍රී ලංකාවෙන් පිටතට ගෙන යා හැකිය.

### විදේශීය මුදල් ශ්‍රී ලංකාවට ගෙන යාම

යම් තැනැත්තකුට සාමාන්‍ය බැංකු මාර්ග ඔස්සේ සීමාවකින් තොරව නීත්‍යානූකූලව අත්කරගත් විදේශීය මුදල් ශ්‍රී ලංකාවෙන් පිටත කුමන හෝ ස්ථානයක සිට ශ්‍රී ලංකාව තුළට එවිය හැකිය. මගියකු ශ්‍රී ලංකාව තුළට ගෙන එනු ලබන සමස්ත විදේශීය මුදල්වල වටිනාකම එක්සත් ජනපද ඩොලර් 15,000 ක් හෝ වෙනත් විදේශ මුදල්වලින් ඒ හා සමාන අගයක් ඉක්මවා යන්නේ නම්, එම මගියා ශ්‍රී ලංකාවට පැමිණි විට ශ්‍රී ලංකා රේගුව වෙත ප්‍රකාශයක් මගින් සටහන් කළ යුතුය.

තවද එම තැනැත්තා එක්සත් ජනපද ඩොලර් 5,000 ක් හෝ අන් විදේශ මුදල්වලින් ඒ හා සමාන අගයක් ඉක්මවා යන විදේශ ව්‍යවහාර මුදල් නෝට්ටු ප්‍රමාණයක් ආපසු නැවත වරක් ගෙන යාමට අදහස් කරන්නේ නම්, එම තැනැත්තන් විසින් ගෙන යනු ලබන විදේශ ව්‍යවහාර මුදල් නෝට්ටු පිළිබදව ශ්‍රී ලංකා රේගුව වෙත ප්‍රකාශ කර සිටීම අවශ්‍ය වේ.

### විදේශීය මුදල් ශ්‍රී ලංකාවෙන් ගෙන ඒම

බලය ලත් ගනුදෙනුකරුවකුට සිය සාමාන්‍ය ව්‍යාපාර කටයුතුවල දී අත් කරගෙන ඇති විදේශ මුදල් ඔහුට ලබා දී ඇති අවසරයේ නියමයන් තුළ ශ්‍රී ලංකාවෙන් පිටතට යැවිය හැකිය.

ශ්‍රී ලංකාවේ පදිංචි තැනැත්තකුට විනිමය පාලන පනතේ විධි විධානවලට හෝ එම පනත යටතේ කරන ලද හෝ නිකුත් කරන ලද රෙගුලාසි, දැන්වීම් හෝ නියෝගවලට අනුකූලව ඔහු විසින් බලය ලත් ගනුදෙනුකරුවකු හෝ බලය ලත් තැනැත්තකු වෙතින් ලබා ගනු ලැබූ විදේශ මුදල් ශ්‍රී ලංකාවෙන් පිටතට ගෙන යාමට හෝ යැවීමට හැකිය.
ශ්‍රී ලංකාවෙන් පිටත පදිංචි තැනැත්තකුට තමා අවසන් වරට ශ්‍රී ලංකාවට පැමිණි අවස්ථාවේ දී තමා විසින් ශ්‍රී ලංකාව තුළට ගෙන එන ලැබූ විදේශීය මුදල් ප්‍රමාණය නොඉක්මවන, වියදම් නොකර, ඉතිරි වූ විදේශීය මුදල් ප්‍රමාණයක් ශ්‍රී ලංකාවෙන් පිටතට ගෙන යා හැකිය. එසේ වුවද ශ්‍රී ලංකාව තුළ සිටින හෝ ශ්‍රී ලංකාවේ පදිංචි තැනැත්තකු විදේශීය මුදල් ශ්‍රී ලංකාවෙන් පිටතට ගෙන යාමේ දී හෝ යැවීමේ දී එම තැනැත්තා මගීන්ගේ ගමන් බඩු ප්‍රකාශය මාර්ගයෙන් ශ්‍රී ලංකා රේගුව වෙත ප්‍රකාශයක් කිරීමේ කොන්දේසියට යටත්වන අතර, එය ශ්‍රී ලංකාවෙන් පිටතට ගෙන යන හෝ යවනු ලබන විදේශීය මුදල් වටිනාකම සමස්තයක් වශයෙන් එක්සත් ජනපද ඩොලර් 10,000 ක් හෝ වෙනත් විදේශීය මුදල්වලින් ඒ හා සමාන අගයක් ඉක්මවා යන්නේ නම් සහ හෝ ශ්‍රී ලංකාවෙන් පිටතට ව්‍යවහාර මුදල් නෝට්ටු වශයෙන් ගෙන යන හෝ යවනු ලබන විදේශීය මුදල් වටිනාකම සමස්තයක් වශයෙන් එක්සත් ජනපද ඩොලර් 5,000 ක් හෝ අන් විදේශීය මුදල්වලින් ඒ හා සමාන අගයක් ඉක්මවා යන්නේ නම් රේගුවට ප්‍රකාශයක් සිදු කළ යුතුය.

LANKAN
AUTO CARE
Licensed Roadworthy Tester (R.W.C)



ALL MECHANICAL REPAIRS
LOG BOOK SERVICE | ELECTRICAL REPAIRS
AUTO TRANSMISSIONS | BRAKES & CLUTCHES
FUEL INJECTION | COMPUTER DIAGNOSTIC




MELWAY REF 89 J 5

Ranjith Perera
Mob: 0409 866 886
9798 2200
14/30 Tower Court
Noble Park 3174